# හැඳින්වීම

ප්‍රේක්ෂක සහභාගීත්වයෙන් සජීවීව කරන කලාව යනුවෙන් ප්‍රාසාංගික කලාව ඉන්දියානුවන් හඳුනා ගනිති. ප්‍රසංග කලාවේ වර්ධනයට හැකියාවක් ඇති රුකුල් දෙන තොරතුරු දෙන මූලාශ්‍ර සපයන යුග පිළිබඳ සොයා බලන විට එයින් ලංකාවේ වැඩි අවධානයක් යොමු වන්නේ කෝට්ටේ යුගයටය.

කෝට්ටේ යුගයේ පැවති කලාවන් පිළිවෙළට කිව හැක්කේ තත් කාලීන සාහිත්‍ය ග්‍රන්ථ වලින් පමණක් බව පෙනේ. කෝට්ටේ සමයේ සිංහල ජාතිය ලැබූ විශාලම කලා දායාදය සන්දේශ කාව්‍යයෝය. කෝට්ටේ යුගය වන විට වැඩියක්ම කවි ලියන ලද්දේ සමුද්‍රඝෝෂ වෘත්තයට බව පෙනී යයි. කෙටියෙන් කීමට පුරුදුව සිටි ජනයා මේ කාලය වන විට යමක් දිග්ගස්සා කීමට හැඩ ගැසී තිබේ. කෝට්ටේ යුගයට අයත් යයි නිශ්චය වශයෙන් කිව හැකි චිත්‍රයක්වත් පිළිමයක්වත් නැති වීම විශාල පාඩුවකි. එහෙත් සන්දේශ කාව්‍යයන්හි සඳහන් වන අන්දමට එකල මේ එකකින්වත් අඩු පාඩුවක් වී නැත. 14 වැනි ශත වර්ෂයෙහි ලියා ඇති එළු අත්තනගලු වංශය අනුව පස් මහල් ජේයාවේ වූ චිත්‍ර වර්ණනා කළ නොහැකිය. මේ ආදී වශයෙන් කෝට්ටේ යුගයට අයත් ග්‍රන්ථ වල එකල පැවති සිතුවම් ගැන සඳහන්වී ඇත. එහෙත් අභාග්‍යක මහත එයින් එකම තැනකවත් තිබුණු චිත්‍ර වලින් පතුරු කැබැල්ලක්වත් නැත.[1]

එම නිසා කෝට්ටේ යුගය මුල් කරගෙන ලංකාවේ ප්‍රසංග කලාව වර්ධනයට රුකුල් දෙන ඓතිහාසික සාහිත්‍ය මූලාශ්‍ර පිළිබඳ අධ්‍යයනය කිරීමත්, එම මූලාශ්‍ර වලින් ප්‍රසංග කලාව පිළිබඳ කියවෙන ලිඛිත සාධක මූලාශ්‍ර පිළිබඳ සොයා බැලීමත්, එමඟින් ලංකාවේ ප්‍රසංග කලාවට ලැබුණු රුකුල පිළිබඳ තොරතුරු හෙළි කර ගැනීමත් මෙහි පරමාර්තයයි. ඒ අනුව කෝට්ටේ යුගයේ සාහිත්‍ය අනන්‍යතාව, පුරෝගාමීත්වය, සාහිත්‍ය කෘති හා එම කෘති වලින් හෙළි වන තොරතුරු, සාහිත්‍ය සුවිශේෂත්වය, සාහිත්‍ය අධ්‍යාපනය, සාහිත්‍ය නව මං පෙත් හා සාහිත්‍ය විවිධත්වය පිළිබඳ සොයා බැලීම කෙරේ.

කෝට්ටේ යුගයේ ප්‍රසංග කලාව පිළිබඳ හැඳින්වීම, ඒ හා බැඳුණු මූලාශ්‍ර හැඳින්වීම, ප්‍රසංග කලාව හා සාහිත්‍ය මූලාශ්‍ර අතර පවතින අන්‍යෝන්‍ය සම්බන්ධය, එමඟින් ප්‍රසංග කලාව පිළිබඳ හෙළිවන තොරතුරු හා ඉන් ප්‍රසංග කලා ප්‍රවර්ධනයට රුකුල දැක්වීම, මූලාශ්‍ර ආශ්‍රයෙන් කෝට්ටේ යුගයේ ඓතිහාසික ප්‍රසංග කලාවෙහි පැවැත්ම හා ඒ වටා ගොතුනු වූ සාහිත්‍යමය තොරතුරු හෙළි කරගෙන ඉදිරිපත් කිරීමට හැකි වේ.

[1] සාහිත්‍ය,වික්‍රමසිංහ පියල් මහතා විසිනි, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, 1879, 85/86 පිටුව

"පරාක්‍රමබාහු රජ තෙමේ යුද්ධයෙහි නිපුණයකු වූ අතරම, භාෂා ශාස්ත්‍ර දර්ශනාදිය පිළිබඳ හසළ බුද්ධියක් ඇත්තෙක්ද විය. පැරකුම්බා සිරිතෙහි ඒ බව කියවෙන්නේ මෙසේය.

(77) පැනය කියන විසදන කලැ මිළිදු නිරිඳු සදිසි හද
විනය සුත බිදම් එසමය සකුසත දිං නාග පාද

(79) මුනි රද අප වදහළ ලෙස කළ ත්‍රිපිටක තෙපල පාට

ශාත්‍රෝන්නතිය හා විශේෂ උනන්දුවක් දක්වූ මොහු විද්වතුන්ට අනුබල දුන්නේය.

(121) වෙන වෙන කවි නළු අවි සිප් සකල කලා දන විභාග
පිනවන කවි දනමන දන කනත දාන කාළ මේග

ප්‍රපාතවත් නැණවත්, ශාස්ත්‍රාභාලාශී රජකුගේ රාජ්‍ය කාලය තුළ පවත්නා සාමය,සෞභාග්‍ය හා අනුබලය මුල් කොටගෙන උසස් ශාස්ත්‍රෝන්නතියක් ඇති වීම පුදුමයට කරුණක් නොවේ. කෝට්ටේ යුගය සිංහල සාහිත්‍යයෙහි ස්වර්ණමය යුගයයැයි සැලකිය හැකි තරමට වැදගත් වූයේ මේ කරුණු නිසාය. "[2]

කෝට්ටේ යුගයේ බිහිවූ අද්විතීය සාහිත්‍ය මූලාශ්‍ර වර්තමාන ප්‍රසංග කලාවන්හිදී විවිධ මාධ්‍යයෙහි විවිධ පැතිකඩ භාවිතා කරමින් ප්‍රතිනිර්මාණය වීම පිළිබඳ හැඳින්වීම හා එමඟින් වර්තමාන ප්‍රසංග කලාව කෙරෙහි බලපා ඇති බලපෑම පිළිබඳ කරුණු විදහා දැක්වීම මෙමඟින් අපේක්ෂා කෙරේ.

දේවාලයෙහිත් රඟ මඬලයෙහිත් රාජ සභාවයෙහිත් නටන නාට්‍යාංගනාවන් ගැන පමණක් පොත පතේ සඳහන් වන මුත්, කෝට්ටේ කාලය වන විට නැටුම් කලාව සැලකිය යුතු දියුණුවක් ලබා තිබුණු බව අනුමාන වශයෙන් සිතාගත හැකිය. උඩරට නැටුම උපන් කොහොඹා කංකාරිය කෝට්ටේ රාජධානිය කාලයේත් පැවති බව ඊට එක්වී තිබෙන කුවේණි අස්නෙන් පෙනේ. කෝට්ටේ කාලයේ ලියන ලද කුවේණි අස්නේ කියමන් අද පවා කොහොඹා කංකාරියේ කියනු ලැබේ. යාගහෝම ආදිය සිංහලයන් අතරට පත් වූයේද මේ කාලයේ බවට සාධක තිබේ. එකල රටට ගලා ආ බ්‍රාහ්මණයන් දුර්වල කිරීමට යාග හෝම කවි රාහුල හාමුදරුවන් සිංහල බසින් ගළපා දුන් බව කියන කට කථාවක් අද පවතී. මේ නව වෘත්තය නියම නැටුම් කලාවට මද වශයෙන් වත් ආධාර ලැබෙන්නට ඇත.[3]

උක්ත කරුණු ඔස්සේ විභාග කොට බලා කෝට්ටේ යුගයේ සාහිත්‍ය මූලාශ්‍ර ලාංකේය ප්‍රසංග කලා ප්‍රවර්ධනයට ශක්‍යතා පෙන්නුම් කරන බැව් හෙළිදරව් කිරීම මෙහිදී සිදු කෙරේ.

---

[2] සාහිත්‍ය,ගුරුගේ ආනන්ද මහතා, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, 1979, බිනර මස, 18 පිටුව
[3] සාංහිත්‍ය, වික්‍රමසිංහ පියල් මහතා, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, 1879, 88 පිටුව